# අපූරු බෝනික්කා



දිනාදි සෙනුල්යා අමරසිංහ

කෘතියේ නම: අපුරූ බෝනික්කා

කතෘගේ නම: දිනාදි සෙනුල්යා අමරසිංහ

කතෘගේ වෙනත් කෘති: අඹ යාළුවෝ

කෘතිය පළ කරන දිනය:

ISBN 978-624-206-848-0

පිදුම□

මාගේ මේ නිර්මාණය

මහනුවර මහාමායා බාලිකා විදුහලේ

4 C ශ්‍රේණියේ

මාගේ ආදරණීය පන්තිභාර ගුරු මැණියන් වන

ප්‍රියන්ති ජයසේකර ගුරු මෑණියන්ට

සහ

මාගේ ආදරණීය දෙමාපියන්ට ගෞරවයෙන්
පිරිනමමි□

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ළදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

එකෝමත් එක කාලෙක සුජානි කියලා පුංචි ගැහැණු ළමයෙක් හිටියා. දවසක් එයාගේ අම්මා වෙළඳසැලට ගියා. එවිට ඇය දැක්කා ලස්සන බෝනික්කෙක් ඉන්නවා. ඇය සිතුවා සුජානි බෝනික්කාට කැමති වෙයි කියලා.



ඇයට වෙළෙන්දා මෙසේ පැවසුවා.

" ඔය බෝනික්කා හරිම අපූරු වැඩ කරනවා."

ඇයට මේ ගැන පුදුම හිතුනා.



සුජානිගේ අම්මා මෙහෙම ඇහුවා.

" මේ බෝනික්කා ඇත්තටම අපූරු වැඩ කරනවද?"

මෙය ඇයට මහත් පුදුමයක් ගෙන දුන් කරුණක් විය.



ඇය ගෙදර ගිහින් සුජානිට බෝනික්කා දුන්නා.

සුජානි බෝනික්කා එක්ක සෙල්ලම් කළා.

අම්මාට කියන්න අමතක වුණා මේ බොනික්කා අපුරු වැඩ කරන කෙනෙක් බව.

සුජානි බෝනික්කාට ගොඩක් ආස වුනා.

සුජානි බෝනික්කා ඇයගේ පාඩම් මේසය
මත තැබුවා.

ඉන් පසු ඇය කෑම කන්න ගියා.

සුජානි අම්මට කිව්වා ඇය බෝනික්කාට
ගොඩාක් කැමති බව.

සුජානිගේ අම්මා ගොඩාක් සතුටට පත් වුනා.



සුජානි නැවත කාමරයට පැමිණෙන විට ඇගේ පාඩම් පොත්වල කුරුටු ගා තිබෙනු ඇය දුටුවා.

ඇගේ බෝනික්කා එවිට ඇගේ ඇඳ උඩ සිටි අතර බෝනික්කාගේ අතේ පාට තැවරී තිබුණි.

සුජානි සිතුවේ ඇගේ නංගි මෙලෙස පොත්වල කුරුටු ගා ඇති ලෙසය.

සුජානි නංගිගෙන් ඇහුවාව “ඔයාද මේ වැඩෙ කළේ?” කියලා. ඇගේ නංගි එලෙස නොකරන ලද බව පැවසීය.

සුජානි බෝනික්කාගේ අතේ පාට සෝදා නැවති පෙට්ටියට දමා ඇගේ මේසය මත තැබුවාය.

ඉන් පසු සුජානි නින්දට ගියාය.
පසු දා උදැසන ඇය අවදි වී මේසයට ගිය විට ඉතා ලස්සන චිත්‍රයක් මේසය මත විය. බෝනික්කා ද පෙට්ටියෙන් එළියට ඇවිත් තිබුනි.



සුජානි මේ සිදුවීම තම අම්මාට පැවසුවා.

මේ අපූරු වැඩ කරන බෝනික්කෙක් බව
එවිට අම්මාට මතක් විය.

වෙළෙන්දා පැවසූ දේ සුජානීට කීමට ඇයට
අමතක වී තිබුනි.

මේ පිළිබඳව සුජානිට කියූ විට ඇය ගොඩාක්
සතුටට පත් විය.

අම්මාටත් මේ පිළිබඳ ගොඩාක් සතුටුය.

නිමි!

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයිපාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට කඩුපිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023 . 11 . 01